ප්‍රවෘත්ති නිවේදනය
PRESS RELEASE
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு அத்துடன் பெண்கள் மற்றும் சிறுவர் மற்றும் சமூக பாதுகாப்பு
Ministry of Women & Child Affairs, Social Security, Health & Indigenous Medicine Services
Telephone office: 2693919 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

**2020.04.11**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී /ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

# මුහුණු පොතෙහි පළ වූ අසත්‍ය පුවතක් පිළිබඳව සෞඛ්‍ය ලේකම්තුමිය කරුණු දක්වයි.

**"තව දින දෙකකින් කොරෝනා රෝගීන් වාර්තා නොවනු ඇත. හේතුව ඇවැසි swabstick නොමැතිවීමයි"** යනුවෙන් මුහුණු පොතෙහි පළ කර ඇති පුවත සම්පූර්ණ සාවද්‍ය පුවතක් බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හද්‍රානි ජයවර්ධන මහත්මිය අවධාරණය කරයි.

COVID-19 වෛරසය පාලනය හා මැඩපැවැත්විම සඳහා අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමිය ගෙනයන වැඩපිළිවෙල අකර්මණ්‍ය කිරීමේ චේතනාවෙන් පාලිත රාජපක්ෂ නැමැති පුද්ගලයෙකු විසින් එම අසත්‍ය පුවත මුහුණු පොත ඔස්සේ ප්‍රචාරය කොට ඇති බව සෞඛ්‍ය ලේකම්තුමිය පෙන්වා දෙයි.

මේ වනවිට රජය සහ සෞඛ්‍ය අංශ විසින් COVID-19 වෛරසය පාලනය හා මැඩපැවැත්වීම සඳහා ගනු ලැබූ තීන්දු තීරණ සහ වැඩපිළිවෙල ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පැසසුමට ලක්ව ඇති අවස්ථාවක තව තවත් සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කරමින් වෛරසය මැඩපැවැත්වීම සඳහා වන PCR පරීක්ෂණ ධාරිතාවය ද ඉහළ නංවා ශක්තිමත් කරමින්, කටයුතු කරන මෙවැනි අවස්ථාක මෙවැනි අසත්‍ය ප්‍රචාර සිදු කිරීම කිසිසේත් අනුමත නොකරන බව ද සෞඛ්‍ය ලේකම් තුමිය අවධාරණය කරයි.

අදාල සාවද්‍ය පුවත මුහුණු පොත ඔස්සේ පළ කිරීම පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල අංශ දැනුවත් කර ඇති බව ද සෞඛ්‍ය ලේකම් හද්‍රානි ජයවර්ධන මහත්මිය වැඩිදුරටත් දන්වයි.

විරාජ් අබේසිංහ
(මාධ්‍ය ලේකම්)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය